# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2323/10 – 2023 මාර්තු මස 13 වැනි සඳුදා – 2023.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2020/261.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. එම්. ජී. නන්දන මයා, ගිණුම් නිලධාරි (විශ්‍රාමික), අංක 32/1, ජනප්‍රිය මාවත, අළුබෝමුල්ල, පානදුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, යක්කල, ගම්පහ පාර, නෑඹිලි කොටුව වත්ත, අංක 03 හි, රමාල් අයි. සිරිවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 මාර්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2020/261.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. එම්. ජී. නන්දන මයා, ගිණුම් නිලධාරි (විශ්‍රාමික), අංක 32/1, ජනප්‍රිය මාවත, අළුබෝමුල්ල, පානදුර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවය කළ ඩී. එම්. ජී. නන්දන මහතාට,

- 2002.03.01 දින සිට 2009.04.07 දින දක්වා වැඩ බැලීම සිදුකළ සහකාර ගණකාධිකාරි තනතුර හා වැටුප හිමි ද? හිමි නම් එය ලබා නොදීම හා
- 2013.12.06 දින සිට 2020.05.05 දින දක්වා රාජකාරි කටයුතු කළ MM 1-1 බාණ්ඩයේ II ශ්‍රේණියට අදාළ ගිණුම් නිලධාරි තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් දීමනාව හිමි ද? හිමි නම් එය ලබා නොදීම

මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

202 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 - 0156

මගේ අංකය: IR/COM/04/2020/44.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. එල්. එච්. ජේ. චන්දක ප්‍රියදර්ශන මයා, අංක 33/1, කුරුඳුවත්ත පටුමඟ, කලුවල පාර, කොස්සින්න, ගනේමුල්ල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා සතොස ලිමිටඩ්, අංක 27, සතොස මහලේකම් ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, පන්නිපිටිය, කළල්ගොඩ පාර, අංක 15, ජෝන් කීල්ස් නිවාස සංකීර්ණයහි, කැප්ටන් එම්. ජී. පී. මෙන්ඩිස් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 මාර්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2020/44.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජී. එල්. එච්. ජේ. චන්දක ප්‍රියදර්ශන මයා, අංක 33/1, කුරුඳුවත්ත පටුමඟ, කලුවල පාර, කොස්සින්න, ගනේමුල්ල

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා සතොස ලිමිටඩ්, අංක 27, සතොස මහලේකම් ගොඩනැගිල්ල, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''ලංකා සතොස ලිමිටඩ්හි කළමනාකරණ (ප්‍රසම්පාදන) තනතුර සඳහා තෝරා ගැනීමේ දී සහකාර කළමනාකරණ ( මිලදී ගැනීම්) ලෙස 2017 මාර්තු සිට සේවය කරන ලද ජී. එල්. එච්. ජේ. චන්දක ප්‍රියදර්ශන මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 03 - 157

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.